

# ආරුගම්බේ වෙරළ තාමත් රැළි නගනු ඈතට පෙනේ....

"මහත්තයා මේ මගේ නංගි නන්දා.." විමලෙ අංකල් අසල හිටපු කාන්තාව පෙන්වා පැවසීය..

මම ඇයට මද සිනාවක් එල්ල කලෙමි..

"මහත්තයල කනවානම් පොතුවිල් වලට යන්න මෙහේ කඩවල කෑම ටිකයි දෙන්නෙ.. මහත්තයාලට නම් මදිවෙයි.." බදුල්ලේ නැන්දාගෙ උඌරුවට සමාන උඌරුවකින් ඇය පවසන විට මම ඇය දෙස බැලීමි.. ඇය නමින් නන්දාය. වයස අවුරුදු 38 පමණ විය හැක. ගම්පෙරලියේ නන්දාට වඩා රූමත්කමින් අඩුය.. ඇය කළුය මහතය.. ඇගේ දෙතොල් දෙකෙලවරින් බුලත් කෙල බේරී ඇති බවට ලකුණු ඇත..

"එහෙනම් මම යන්නම් අයියේ..." කුඩයත් පන් මල්ලත් අතට ගෙන අසුනින් නැගිට්ටාය..

"යන්නම් මහත්තයා..."

ආචාරශීලී සිනාවක් සමග ඇයගේ සමුගැනීම සටහන් වුනේ එලෙසිනි.. මම මද සිනාවකින් ඇයට ප්‍රති උත්තර දුනිමි...

විමලෙ අංකල් ඇය ඈතට යනතුරු බලා සිටියේය.

අපේ තාවකාලික නවාතැනේ භාරකරු විමලේ අංකල්ය.. දීර්ඝකාලයක් තුල දෙමල කතාකිරීම නිසා-දෝ ඔහු කතාකරන විටදී මද වෙනස්කමක් ශ්‍රවණය වේ. කතාකරන අතරතුර අසාමාන්‍ය ලෙස බෙල්ලේ ගැස්සීමක් ඇත. එය රූපවාහිනියේ කතාවල අණ්ඩපාලයින් හා මෝඩයින් ගේ ලක්ෂණයක් ලෙස උලුප්පා දක්වන බෙල්ලේ ගැස්සීමට සමානය.. ඒවාට පින්සිද්ද වන්නට මමත් මුලින් විමලේ අංකල් ගැන නිගමනය කලේ එසේය...

"ඕකි මගේ නංගි" විමලේ අංකල් හඬ අවදි කළේය...

"බැන්දෙ අවුරුදු 17න් ඒකාලෙත් කළුයි ඒ වුනාට ලස්සන කෙල්ල, මගේ මස්සිනා ඒ කියන්නේ ගුණපාල ඒ කාලෙ පොතුවිල් වල හිටපු හොඳම හෝටල් කාරයෙක්, නන්දාට වඩා අවුරුදු පහයි වැඩිමල්.. උඌ මේකිව දැකලා මගෙන් කෙලින්ම ඇහුවා.. අම්මත් තාත්තත් නැති එකේ මම මොනවා කරන්නද මහත්තයා.. මම ඇහුවාම නන්දාත් කැමතියි කිව්වා. චාමෙට ලස්සන මගුලක් කලා, නන්දා ගුණයාගේ ගෙදර ගියා.."

"එහෙනම් අපිට කෑම ගුණපාලගේ කඩෙන් ගන්න පුළුවන්නෙ" පොතුවිල් වල දන්නා කඩයකින් කෑම ගැනීම කෝකටත් හොඳය..

"දැන් කොහෙද ගුණපාලයෙක්.. හරියටම බැඳලා අවුරුදු දෙකයි වුනේ.. නන්දාට ලමයෙක් හම්බ-වෙන්න හිටියේ, මහත්තයාට පරක්කු වෙනවාද?"

"නෑ නෑ..."

මට එවෙලේ තිබුනේ කතාව ඇසීමේ උනන්දුවකි.. විමලේ අංකල් කාමරය ඇතුලට ගොස් කරන්ට් තිබේදැයි පරීක්ෂා කර බලයි..

"මේන් ලයින් එකේ රෙපයාර් එකක්ලු තව ටිකකින් එයි"

විමලේ අංකල් එහෙම කියන්නට ඇත්තේ මා කලිනුත් කරන්ට් නැති එක ගැන පැමිණිලි කල නිසා වෙන්නට ඇති..

"නෑ ප්‍රශ්නයක් නෑ, කොහොමත් අපි කාලා එහෙමම බීච් එකට යනවා..."

"දවසක් එකපාර කොටි වගයක් ආවා උන් ආවේ වෑන් වලින්.. සිංහල පිරිමි පහලොවක් අරන් ගියා රෑ කැලේදී ඔළුවට පොරවකින් ගහලා උන් ඔක්කොම මරලා දාලා.. "

මට අමුතුවෙන් ගුණපාල එතන සිටියාදැයි අසන්නට උවමනාවක් නොවීය.. මෙවෙලේ නන්දා හිටියානම් අඬන්නට ඉඩ තිබුනි. නමුත් විමලේ අයියා ඇඩුවේ නැත..

"ඒ කාලේ නැගෙනහිර කොටි නායකයා දැන් ඇමති කෙනෙක්.. සටන් විරාම කාලේ තමා උන් ඕනි ඕනි විදිහට මිනිස්සු මරන්න ගත්තේ. ඒක නිසා මම අලියාට කතිරෙ ගහන්නේ නෑ.. ජනාධිපතිතුමා යුද්දෙ ඉවර කරලා මගේ මස්සිනා මරපු එකාට ඇමතිකමක් දුන්නා.. මම ඊළග ඡන්දෙ කාටද දෙන්නෙ මහත්තයෝ.."

සිය දේශපාලන ස්ථාවරය නාඳුනන මිනිසුන් සමග කතාකිරීම අන්තරාදායක නිසාත් මට ප්‍රමාද වන නිසාත් මම යන්නට හැරුනෙමි..

"පොතුවිල් වල අරක්කු ගණන් වැඩියි ගන්නවානම් මහත්තයලට සියඹලාණ්ඩුවට යන්න වෙනවා.."

"හා හරි.."

මම ආපසු හැරීවත් නොබලා ආරුගම්බේ වෙරලට ඇවිද යාමට පටන් ගතිමි..

ආරුගම්බේ වෙරළ තාමත් රැළි නගනු ඈතට පෙනේ....

**ආගන්තුකයා**

kirikatiya007@gmail.com





# වම් ඉවුරේ මිනිස්සු

### රාජාංගනේ මතක සටහන්

## වැහැපන් දෙවියෝ කහපැන් දෙඤ්ඤදයි

වම් ඉවුරට ඉහළ ආකහේ එක වළාකුලක් වත් දකින්න නැහැ. ගිණිකාස්ටක අව්ව ගහ කොළ පුච්චලා දානවා. මේ රස්නෙ වම් ඉවුරට ආගන්තුක මට දරා ඉන්ඩ බැරි තරම්.

මොකෑ මේ මහ රාළලා ටිකත් එක් කොරාන කොයින් මාමා බර කතාවක? මේක සිලපේදිරි ඇතිව දැනගන්ට කොයින් මැණිකා ගෙන්ම අහන්ට ඕනෑ. මම කිට්ටු කොරා කොයින් මැණිකා ළඟට.

"මොකෑ ඇස් ගෙඩි දෙකත් උලුප්පාගෙන මා ගාව? බෝට ඉඩ සාය දැනුණායි?"

"ඔහෙ නෑ නගා.. මොකෑ අර කොයින් මාමාලා කොරන්ට තනන්නෙ?"

"බලා ඉඳ.. අද කෙම්මුරේ.. උන්දැලා තනන්නෙ වැස්ස වළාහක දෙයියන්නාන්සෙට ගතු කියන්ට.."

වැඩිහිටියෝ බොහොම උවමනාවෙන් මල් පැලක් හදලා. ඒ ළඟ කදුරු අත්තක් හිටවලා.. පොල් ගෙඩි දෙකක් ගැට ගහලා. මල් පැලේ පහන් පත්තු කරල සුවඳ දුම් අලල්ලා.

එක් වැඩිහිටියෙක් සුදු පිරුවටයක් ඇඳගෙන හිසෙත් සුදු තලප්පාවක් බැඳගෙන. වැස්ස නැති නිසා ගමේ සිදුවී ඇති දුක් කම්කටොලු ගැන දෙවියන්ට දුක් ගැනවිල්ල කියනවා.

සියල්ල අවසානයේ වැඩිහිටියෝ මෙහෙමෙ පොරොන්දු කවියක් කිව්වා.

දොරකඩ පොල් ගහ නින්දෙම දෙඤ්ඤදයි
හානට මී ගොන් බානක් දෙඤ්ඤදයි
අටු ඇට මල්ලක් පුර හම දෙඤ්ඤදයි
වැහැපන් දෙවියෝ කහපැන් දෙඤ්ඤදයි

**බෝගල**








**ජගත් ජේ එදිරිසිංහ ගේ**
"ඉස්කෝලෙ කාලේ" යොවුන් නවකතාව
"තාරකා විජිතය" නවකතාව
"රාජාලි පියාපත" කාව්‍ය සංග්‍රහය
**නව පිටපත් ලැබී ඇත**
**පිටපතක් ඩොලර් 10 (තැපැල් ගාස්තු සමග)**
**විසමන්න**
**Sooriya Marketing Services**
1B/132 Alexander Av Thomastown
VIC 3074 Australia
Tel – 613 9465 8257/ (61) 0433 438 535